# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**යූ.එස්.ඩී. අරුණසිරි**[1]

සංක්ෂේපය

සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන සමජ ආර්ථික ගැටලුවක් වශයෙන් දරිද්‍රතාව හඳුනා ගත හැකිය. තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමේදී පළමුව දරිද්‍රතාව සඳහා පිළියම් ලබාදිය යුතු ය. යම් යම් සමාජීය දර්ශක අනුව ශ්‍රී ලංකාව සමහර අංශවලින් ප්‍රගතියක් අත්කරගෙන ඇති නමුත් ආර්ථික වර්ධනය, ආදායම් ව්‍යාප්තිය හා දිළිඳුකම අවම කිරීම ආදී අංශවලින් ශ්‍රී ලංකාව තවමත් පවතින්නේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොමැත. එහිදී ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඇති විභව ශක්තීන් යථා පරිදි නිරූපණය කර නොමැති බවට පුළුල් වශයෙන් එකඟතා දක්නට ලැබේ. ආංශීය වශයෙන් ගත් කල නාගරික සහ වතු යන දෙඅංශයන්ට සාපේක්ෂව ග්‍රාමීය අංශය වැඩි දරිද්‍රතා අගයක් පෙන්නුම් කරනු ලබයි. නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක්ම දරිද්‍රතා ගැටලුවට පිළියම් වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අතරින් ප්‍රධානතම සහ විශාලතම සුභසාධන හා සංවර්ධන ව්‍යාපෘතිය ලෙස සමෘද්ධි ව්‍යාපාරය 1995දී ආරම්භ විය. මෙම වැඩසටහන සුභසාධන ප්‍රවේශය, ග්‍රාම සංවර්ධන ප්‍රවේශය හා බැංකු සංගම් ප්‍රවේශය යනුවෙන් ප්‍රවේශ ත්‍රිත්වයකින් සමන්විත වේ. මේ අතුරින් සුභසාධන ප්‍රවේශය ග්‍රාමීය දිළිඳු බව අවම කිරීම සඳහා දක්වන දායකත්වය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. පර්යේෂණය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගනු ලැබූ අතර එහි සමෘද්ධිලාභී පවුල් 50ක සසම්භාවී නියැදියක් පරීක්ෂා කෙරිනි. ප්‍රතිචාරකයින්ගෙන් දත්ත ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගැණිනි. පර්යේෂණය තුළින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට හැකි විය. ප්‍රධාන වශයෙන් සමෘද්ධි ව්‍යාපාරයේ ඇතැම් සුභසාධන ව්‍යාපෘතීන් පිළිබඳව ජනතාව කරුණු නොදන්නා බව, ඇතැම් සමෘද්ධිලාභීන්ගේ එකම හා ප්‍රධාන ආදායම් මූලාශ්‍රය සමෘද්ධි සහනාධාරය බව, ජනතාවට සමෘද්ධි ව්‍යාපාරය මගින් ස්වයං රැකියා සඳහා කිසිදු අනුබලයක් ලැබී නොමැති බව ආදිය පර්යේෂණය අනාවරණය විය.

ප්‍රමුඛ පද - දරිද්‍රතාව, සමෘද්ධි ව්‍යාපාරය, සුභසාධන ප්‍රවේශය, සමාජ සංවර්ධනය

*1. ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලයට, ශ්‍රී ලංකාව*